**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව - සති පාසල**

**01. ශ්‍රේණිය : 11** **විෂයය: ගෘහ ආර්ථීක විද්‍යාව** **සතිය : 18 වන සතිය**

**02. පාඩම හෝ ඒකකය: මුල් ළමා වියෙහි දරුවෙකු සඳහා ගවුමක් නිර්මාණය කිරීම**

**03. මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල:**

- මුල් ළමා වියෙහි පසුවන දරුවකු සඳහා ගවුම් පන්නයක් නිර්මාණය කරයි යන නිපුනතා මට්ටමට අදාලව විභාග ප්‍රශ්න වලට සාර්ථකව පිළිතුරු සපයයි.

04. ශිෂ්‍යයා කල යුතු කාර්යයන්:

ඔබ අධ්‍යයනය කර ඇති ගෘහ ආර්ථීක විද්‍යාව පෙළ පොතේ එකලොස් වන පාඩම ඇසුරින් පහත පුනරීක්ෂණ අභ්‍යාස සඳහා පිළිතුරු සපයන්න.

01. i. ළමා ගවුම නිර්මාණයේ දී අවශ්‍යවන, ප්‍රධාන මිම් තුනක් සඳහන් කරන්න.
    ii. ළමා ගවුම කැපීමට පෙර, රෙදි පිරියම් කරන ආකාර තුනක් දක්වන්න.
    iii. මුද්‍රිත තිත් සහිත රෙද්දක් ළමා ගවුම සඳහා තෝරා ගන්නේ නම්, එම තිත් වඩාත් අලංකාර කර ගැනීමට ඔබට භාවිත කළ හැකි විසිතුරු මැහුම් ක්‍රම හතරක් ලියන්න.

02. i. ළමා ගවුම් මැසීමට අවශ්‍යවන මිම් අතරින් වක්‍රාකාර මිම් තුනක් හා ඍජු උස මිම් තුනක් සඳහන් කරන්න.
    ii. ළමා ගවුම මැසූ පසු අලංකාර කර ගැනීමට යොදා ගත හැකි ද්‍රව්‍ය තුනක් නම් කරන්න.
    iii. ළමා ගවුමේ අත සකස් කිරීමට අවශ්‍ය මිම් සටහන් කරන්න.

03. i. ළමා ඇඳුමක් කපා මැසීමේ දී එය අලංකාර කර ගැනීමට යොදා ගත හැකි විශේෂිත අලංකාර ක්‍රම තුනක් ලියන්න.
    ii. පහත සඳහන් මිනුම් ගණනය කර දක්වන්න.
    - පළමු හරස් මිනුම
    - දෙවන හරස් මිනුම
    iii. ළමා ගවුමක් නිර්මාණයේ දී සැලකිළිමත් විය යුතු කරුණු හතරක් දක්වන්න.

04. i. ළමා ගවුමේ කර මසා නිම කිරීමට යොදන ක්‍රම තුනක් සඳහන් කරන්න.
    ii. ළමා ගවුමේ සාය කොටසට යෙදිය යුතු මැහුම් වාසි ප්‍රමාණ දක්වන්න.
    iii. ඇඳුමේ මූලික පතරොම මගින් ඉදිරිපස කඳ කොටසේ ඇඳුම් පන්නයක් නිර්මාණයේ දී එහි වෙනස් කළ යුතු ස්ථාන හතරක්, රූප සටහනක් මගින් ඇඳ පෙන්වන්න.

05. ඉහත අභ්‍යාස සඳහා අවශ්‍ය තොරතුරු තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා අන්තර්ජාලය හා සම්බන්ධ වන්න.

- https://www.youtube.com/watch?v=spN6QCvrI9g
- https://www.youtube.com/watch?v=PSKrhQyQLq4
- https://www.youtube.com/watch?v=JS4XyVc3rvo